**ශීර්ෂය 277 - මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා වේ. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 277 - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 මැයි 31 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.13 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසිය** | **මුදල් රෙගුලාසි 128(1) - ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලවද සම්පූර්ණයෙන්මද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසන බවත්, | 1. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවීම | 2.3 |
| | | 2. අවිධිමත් ගනුදෙනු | 2.6 |
| | | 3. කළමනාකරණ දුර්වලතා | 2.9(ආ) හා (ඇ) |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු | 1. කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු නොකිරීම | 2.12 |
| | | 2. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම | 2.13.1 |

| | | | |
|---|---|---|---|
| | නියමයන් නිකුත් කරන බවත්, | 3. බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම | 2.13.2 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යොක්ෂණය කරනු ලබන බවත්, ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බවත්, | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.4 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාරතා කරන බවත්, | 1. හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත්වීම<br>2. බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රජයේ නිවාසයක හිඟහිටි කුලී අයකර නොගැනීම | 2.11<br>2.9(අ) |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම,කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බවත්, | 1. නිම නොකළ ඉදිකිරීම් කටයුතු<br>2. අපේක්ෂිත අරමුණු ඉටු නොවූ ව්‍යාපෘති<br>3. අත්‍යාවශ්‍ය වැඩ කොටස් ඉටු නොකළ ඉදිකිරීම් | 2.7(අ), (ඉ) හා (ඒ)<br>2.7(ආ), (ඇ),(ඊ), (උ), (ඌ), (එ) හා (ඔ)<br>2.7(ඈ) හා (ඕ) |
| 128(1)(ඒ) | දරන ලද කිසියම් වියදමක් හෝ බැඳීමක් වුවද, තම වැය විෂය පථය හෝ සීමාවන් හෝ වෙනත් බලය දෙනු ලැබූ මුලා ප්‍රතිපාදන ඇතුළත වැටෙන බව හා එය | ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට එළඹීම | 2.5 |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණවත් තරම් අධිකාර බලයකින් ආවරණය වන බවත්, | | |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බවත්, | ගොඩනැගිලි හා ඉදිකිරිම්වල වියදම වැඩියෙන් දැක්වීම | 2.10 |
| 128(1)(ඡ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටත්, මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බවත්, | 1. පාඩු හා හානි<br>2. කොන්ත්‍රාත් වෙනුවෙන් වැඩිපුර ගෙවීම් | 2.8<br>2.7 (ක) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරයන්

(අ) ප්‍රාදේශීය පරිපාලනය හා සම්බන්ධීකරණය
(ආ) සංවර්ධන වැඩසටහන්
(ඇ) නියාමන කටයුතු
(ඈ) ආපදා කළමනාකරණය හා සහන කටයුතු
(ඉ) සමාජ සුභසාධන වැඩසටහන්
(ඊ) රාජ්‍ය ආදායම රැස්කිරීම
(උ) ආගමික හා සංස්කෘතික කටයුතු

## 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමගින් ඉටු කළ යුතු කාර්යභාරයයන්

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ බිබිල, මැදගම, මඩුල්ල, සියඹලාණ්ඩුව, මොනරාගල, බුත්තල, බඩල්කුඹුර, කතරගම, වැල්ලවාය, තණමල්විල , සෙවනගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ස්ථාපිත කර තිබුණු අතර එම ආයතන විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපිත කර ඇති කාර්යයන් ප්‍රාදේශීය මට්ටමෙන් ඉටුකරනු ලැබේ.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යභාරයන් ඉටු කිරිම සඳහා අවශ්‍ය සැපයීම් හා සේවා ලබා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල නොවී පහත සඳහන් වැඩ, සැපයීම් හා සේවා සඳහා ගෙවීම් කර තිබුණු අවස්ථා අනාවරණය විය.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව එකම භාණ්ඩය සැපයීම සඳහා මාස 6 ක කාලයක් ඇතුළත මුල් සැපයුම්කරු වෙතින් ඇණවුම් කළ හැකිව තිබුණත්, එම කාල සීමාව ඉක්මවා 2017 වර්ෂයේදී මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකතුව රු.568,049 ක් වටිනා ඇණවුම් මුල් සැපයුම්කරු වෙත නිකුත් කර මිලදී ගැනීම් සිදු කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.7 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවක තෙවන සාමාජිකයා ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් පරිබාහිර අයෙකු විය යුතු වුවත්, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකතුව රු.මිලියන 41.63 ක් වටිනා ප්‍රසම්පාදන තීරණ 102 ක් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තෙවන නිලධාරීයා වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු පත් කර තිබුණි.

(ඇ) කතරගම යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 3.37 ක් වී තිබුණි. එම ඇස්තමේන්තුගත වටිනාකම අනුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාර ජාතික තරගකාරී ලංසු කැඳවා ප්‍රසම්පාදනය ඉටු කළ යුතුව තිබුණි. එම කර්මාන්තය අදියර දෙකක් ලෙස රු.මිලියන 2 කට අඩුවන පරිදි ඇස්තමේන්තුව කොටස් දෙකකට පිළියෙල කර ජාතික තරඟකාරී ලංසු කැඳවීමෙන් බැහැර වී කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ස්වේච්ඡා සංවිධාන දෙකකට එම කොන්ත්‍රාත්තු ප්‍රදානය කර රු.මිලියන 2.94 ක් ගෙවා තිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවකට වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ රු.මිලියකට අඩු ප්‍රසම්පාදනයන් සිදු කළ හැකිව තිබුණි. එම සීමාව ඉක්මවා වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් රු.මිලියන 1.33 ක් වටිනා බද්ධ පළතුරු පැළ වෙළෙඳ පොල මිල සැසඳුම් ක්‍රමය යටතේ ලංසු කැඳවා මිලදී ගෙන තිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාහනවල ඉන්ධන දහනය පරික්ෂා නොකිරිම**

---

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව වැල්ලවාය, මැදගම හා මඩුල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන 09 ක් සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂා කර නොතිබුණි.

**(ආ) වාහන අනතුරු පිළිබඳ වාර්තා ඉදිරිපත් නොකිරීම**

---

2017 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අනතුරට ලක්වූ වාහන 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.5 බැදීම් හා බැරකම්**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.778,949 ක බැරකම්වලට එළඹ තිබුණි.

**2.6 අවිධිමත් ගනුදෙනු**

---

වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 දෙසැම්බර් මාසයේදී එකතුව රු.මිලියන 1.61ක් වටිනා ගෙවීම් වවුචර් 14 ක් සඳහා මුදල් රෙගුලාසි 139 ප්‍රකාරව වියදම සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

**2.7 කොන්ත්‍රාත් පරිපාලනය**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු කොන්ත්‍රාත් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කතරගම නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 46.33 ක ගිවිසුම්ගත වටිනාකමකට කොන්ත්‍රාත්කරුවෙකු වෙත, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2018 අප්‍රේල් 24 දින සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ 2016 අගෝස්තු 16 දින ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව 2017 නොවැම්බර් 16 දින වන විට ගොඩනැගිල්ල නිමකර අවසන් කළ යුතුව තිබුණත්, එදින වන විටත් එම කටයුතු නිම කර නොතිබුණි. කොන්ත්‍රාත්තුවේ කාලය එදින සිට 2018 මාර්තු 20 දින දක්වා දීර්ඝ කර තිබුණි. 2018 මාර්තු 20 දින වන විට ඒ සඳහා රු.මිලියන 38.68 ක් වැය කර තිබුණත්, 2018 අප්‍රේල් 24 දින වන විටද ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.

(ii) කතරගම ප්‍රදේශය ඉතා ඉහළ උෂ්ණත්වයක් ඇති ප්‍රදේශයක් වන බැවින් මෙම ගොඩනැගිල්ලෙහි වහලය සඳහා උෂ්ණත්වය පාලනය කරන Aluminum Foil ආවරණ යෙදිය යුතුව තිබුණත්, ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී එම අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන පිලිසරු ව්‍යාපෘතිය යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විවෘත සහ සංවෘත කසල අට්ටි ගසන ස්ථානයක් ඉදිකිරීම සහ හැලීමේ, ඇසුරුම් කිරීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 5.04 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2016 අප්‍රේල් 20 දිනැති අංක රු/ම/ක/දෙ/පා/176 දරන රුහුණු මහා කතරගම දේවාලයේ පරිපාලන ලේකම් විසින් මොණරාගල දිස්ත්‍රික් ලේකම් ඇමතූ ලිපිය අනුව මෙම ව්‍යාපෘතියෙන් කතරගම පූදබිම කැලි කසලවලින් තොරව පවිත්‍රව තබා ගැනීම, දිගුකලක සිට පැවැති කැලි කසල බැහැර කිරීමෙන් සිදුවන පරිසර හානි වලක්වා ගැනීම, නිෂ්පාදනය කරන කොම්පෝස්ට් පොහොර දේවාලයේ මල් වත්තට හා හරිතාගාරයේ එළවළු සඳහා යොදාගැනීම සහ අතිරික්තය ප්‍රදේශයේ ගොවි ජනතාව වෙත ලබාදීම අපේක්ෂිත අරමුණු වී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා එකතුව රු.මිලියන 5.04 ක් වැය කර 2016 දෙසැම්බර් 10 දින වන විට ඉදිකිරීම් කටයුතු නිමකර තිබුණද, 2018 අප්‍රේල් 24 දින වන විටත් ඉදිකර තිබුණු ගොඩනැගිලි ප්‍රයෝජනයට නොගැනීම නිසා විනාශ වෙමින් පැවතුණි. දෛනිකව එකතුවන කසල අවිධිමත් ලෙස පිටතට බැහැර කිරීම තුළින් ඩෙංගු උවදුර පැතිරයාමේ අවධානමක්ද පවතින බව නිරීක්ෂණය විය.

(iii) ඉදිකිරීම් කටයුතු සිදුකළ ගොඩනැගිල්ල සඳහා විදුලිය තතැදීම සිදුකර අවශ්‍ය උපාංග සවිකර තිබුණද, 2018 අප්‍රේල් 24 දින වන විටත් විදුලි සම්බන්ධතාවය ලබාගෙන නොතිබුණි.

(ඇ) මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ මාතෘ සායන මධ්‍යස්ථාන 07 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 42.40 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සායන මධ්‍යස්ථාන 07 ක් ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් ආයතනය සමඟ රු.මිලියන 48.64 ක සිවිල් වැඩ වටිනාකමක් සහිතව ගිවිසුම්ගතව තිබුණද, කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 42.40 ක වැඩ කොටස් පමණක් ඉටුකර තිබුණි. ඇස්තමේන්තුවේ හා කොන්ත්‍රාත් ගිවිසුමේ ඇතුළත් Valance boards සකස් කිරීම, Aluminum foil සපයා ඇතිරීම, Eave gutters සපයා සවිකිරීම, Down pipe සපයා සවිකිරීම හා Iron grill සකස් කර සවිකිරීම සඳහා රු.මිලියන 1.97 ක වැඩකොටස් කොන්ත්‍රාත්කරු විසින් ඉටුකර නොතිබුණි. මේ නිසා ඇස්තමේන්තු කළ ආකාරයට ගොඩනැගිලිවල සිදු කළ යුතු අත්‍යාවශ්‍ය වැඩකොටස් අතහැර ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) සායන මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පිළියෙල කර තිබුණු ඇස්තමේන්තුවල පේමන්ට් ඉදිකිරීම, විදුලි පංකා සවිකිරීම සහ මධ්‍යස්ථාන දෙකක වැසිකිලි පහසුකම්

සකස් කිරීම යන ඉදිකිරීම්වලට අදාළ අත්‍යාවශ්‍ය වැඩකොටස් අතහැර තිබුණි. අවසන් බිල්පත්‍ර සකස් කිරීමේදී ඇස්තමේන්තු වටිනාකමට වඩා නිම්වැඩ වටිනාකම අඩුවී තිබුණු අතර ඒ අවස්ථාවේදී හෝ අතිරේක වැඩ කොටස් ලෙස එම වැඩ කොටස් ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ 2017 වර්ෂයේ දක්ෂිණ කළාපීය සංවර්ධන වැඩසටහනේ අංක 01 වගා ළිඳ ඉදිකිරීමේ කර්මාන්තය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන සලසා තිබුණි. එම ඉදිකිරීම සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.878,977 ක් වැය කර තිබුණි. වගා ළිඳ ඉදිකිරීමට අදාළ සාධ්‍යතා වාර්තාවට අනුව “ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය ජලය සැපයීම මගින් කෘෂිකර්මාන්තය දියුණු කිරීම හා ගොවි පවුල්වල ආදායම් තත්ත්වය ඉහළ නැංවීම” යන අරමුණු ඉටු කර ගැනීම මෙම ළිඳ ඉදිකර ගැනීමෙන් අපේක්ෂා කර තිබුණි. ළිඳ ඉදිකර ඇති ඉඩම් කොටස නිත්‍යානුකූලව පවරාගෙන නොතිබුණු අතර අපේක්ෂා කර තිබුණු අරමුණු ඉටු කර ගැනීමට නොහැකිවීමෙන් වගාළිඳ ප්‍රයෝජනයට නොගැනීම නිසා එය දැඩි ලෙස අපවිත්‍ර වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ විහාරස්ථානයක ප්‍රජාශාලාවක් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.484,963 ක් වැයකර ද්‍රව්‍ය මිලදී ගෙන ස්වේච්ඡා සංවිධානයක් වෙත භාර දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගොඩනැගිල්ල සඳහා කුළුණු ඉදිකිරීමට වලවල් සකස් කිරීම පමණක් සිදුකර තිබුණු අතර ලබාදුන් ද්‍රව්‍ය උපයෝගී කරගෙන ගොඩනැගිල්ල ඉදිකිරීම අවසන් කර නොතිබුණි.

(ඊ) 2017 වර්ෂයේ විමධ්‍යගත අයවැය සංවර්ධන වැඩසටහන යටතේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.194,000 ක් වැය කර ජලයේ ගිල්විය හැකි විදුලි වතුර මෝටරයක් ප්‍රජාමූල සංවිධානයක් වෙත ලබා දී තිබුණි. 2017 මාර්තු 20 දින වන විටත් එම ජල මෝටරය ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර එය ප්‍රතිලාභියෙකුගේ නිවසේ තබා තිබුණි.

(උ) බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කරවිල ඇල්ල උඩමාර්ගය ගෑවල් කිරීමේ ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා රු.248,507 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මාර්ගය මෝටර් ග්‍රේඩර් කර පස් යොදා නියමිත පරිදි සකස් කිරීම සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත් මාර්ගය මෝටර් ග්‍රේඩර් කිරීමෙන් පසුව වර්ෂාව ඇති වී මාර්ගය මඩ වීම නිසා එම මඩ සහිත පස් ඉවත් කිරීමට සියලුම මුදල් වැය කිරීම නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ කාර්ය ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

(ii) මාර්ගයේ මඩ ඉවත් කිරීමට ගෙවීම් කිරීමේදී මාර්ග මිල ගණන් උපලේඛනයේ සඳහන් නියමිත රේටය යොදා නොගැනීම නිසා රු.185,125 ක් කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණි.

(ඌ) 2016 වර්ෂයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනේ දොඹගහවෙල ජල යෝජනා ක්‍රමය යටතේ නළ ළිඳක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණි. එම ඉදිකිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.492,565 ක් ජාතික ජලසම්පදානය හා ජලාපවහන මණ්ඩලය වෙත ගෙවා තිබුණි. ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් ළිඳ ඉදිකර තිබුණද, ප්‍රතිලාභීන් සඳහා ජලය ලබාගැනීමට හැකි වන පරිදි

අත්පොම්පය සහිත නල ළිඳෙහි ඉහළ කොටසෙහි ඉදිකර නොතිබුණි. මේ නිසා ඉදිකර තිබුණු ළිඳෙන් ප්‍රතිලාභීන් විසින් ප්‍රයෝජනයක් ලබා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(එ) ප්‍රදේශයේ ජනතාවට පානිය ජලය හා වෙනත් ජල අවශ්‍යතා සපයාදීම සඳහා 2016 වර්ෂයේදී ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ කෙහෙල්අත්තාවෙල ප්‍රජා ජල ව්‍යාපෘතිය දීර්ඝ කිරීමේ කර්මාන්තය බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණි. මේ සඳහා මි.මී. 63, 40 හා 32 ප්‍රමාණයේ PVC ජලනල 456 ක් මිලදී ගැනීමට රු.494,340 ක් වැය කර තිබුණි. මිලදී ගෙන තිබුණු එම ජලනල අදාළ කාර්යය සඳහා යොදාගෙන නොතිබුණු අතර පුද්ගලික නිවසක පිටුපස අනාරක්ෂිතව තබා තිබුණි. මෙම කර්මාන්තය ඉටු නොකිරීම නිසා ඉන් අපේක්ෂා කළ අරමුණු ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඒ) 2016 වර්ෂයේ විමධ්‍යගත අයවැය සංවර්ධන වැඩසටහන යටතේ නාගල සෞඛ්‍ය මධ්‍යස්ථානය අසල පොදු ඉඩමේ ප්‍රජා මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ සඳහා බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.198,915 ක් වැයකර ඉදිකිරීම් භාණ්ඩ මිලදීගෙන ස්වේච්ඡා සංවිධානයක් වෙත ලබාදී තිබුණි. අළුතින් කාමරයක් ඉදිකිරීම සඳහා එම භාණ්ඩ මිලදී ගෙන ලබාදී තිබුණද, කාමරය ඉදිකිරීම සඳහා කොන්ක්‍රීට් කුලුණු ඉදිකිරීමට කම්බි පමණක් යොදා තිබුණි. ඉන්පසු ඉදිකිරීම් කටයුතු අත්හැර තිබුණි.

(ඔ) ප්‍රදේශයේ ජනතාවගේ දෛනික ජල අවශ්‍යතාවය සපුරා දීම, සෞඛ්‍ය සම්පන්න ජල සැපයුම හා වගා කටයුතු සඳහා ජල සැපයුම ලබාදිම යන අරමුණින් ඉලුක්කුඹුර රත්මිණිගම ජල ව්‍යාපෘතියේ ඉලුක්කුඹුර ළිඳ සෑදීම වෙනුවෙන් මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.687,188 ක් වැය කර තිබුණි. ඉදිකර තිබුණු ළිඳ වෙත ප්‍රවේශවීමේ මාර්ගය වල් බිහිවී තිබුණි. සෞඛ්‍ය සම්පන්න ජල සැපයුමක් ලබා දීම ව්‍යාපෘතියේ එක් අරමුණක් වී තිබුණත්, ළිඳෙහි ජලය පානීය ජල අවශ්‍යතා සඳහා සුදුසු බවට පරීක්ෂා කර වාර්තාවක් ලබාගෙන නොතිබුණි. එමෙන්ම අපද්‍රව්‍ය වැටීම වැලැක්වීම සඳහා ආවරණයක් හෝ සකස් කර සවිකිරීමටද ක්‍රියාකර නොතිබුණි. මේ නිසා ප්‍රදේශයේ ප්‍රතිලාභීන් විසින් ඉදි කර තිබුණු ළිඳෙන් තම ජල අවශ්‍යතාවය ලබා නොගන්නා බව නිරීක්ෂණය විය.

(ඕ) කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කතරගම ගෙස්ටුපාන ඇළ කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ හැඩයම් ලැලි යෙදීම වෙනුවෙන් රු.317,255 ක් වැය කර තිබුණි. යොදා තිබුණු එම හැඩයම් ලෑලිවල දුර්වල නිමාවක් නිරීක්ෂණය විය.

(ක) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන තණමල්විල, කතරගම, සෙවනගල, සියඹලාණ්ඩුව, මැදගම, බිබිල, බඩල්කුඹුර හා වැල්ලවාය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කර තිබුණු මාර්ග ව්‍යාපෘති 120 ක් වෙනුවෙන් රු.මිලියන 4.72 ක්ද, සංවර්ධන ව්‍යාපෘති 27 ක් වෙනුවෙන් රු.මිලියන 1.17 ක්ද හා ක්‍රිඩාපිටියක පස් ඉවත් කර සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.මිලියන 0.19 ක් වශයෙන් එකතුව රු.මිලියන 6.08 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩිපුර ගෙවා තිබුණි.

## 2.8 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සියඹලාණ්ඩුව සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාස ඉදිකිරීමේ කර්මාන්තය සඳහා පළමු වර ලංසු කැඳවා තිබුණි. ඒ අනුව රු.මිලියන 6.16 ක ලංසු ඉදිරිපත් කර තිබුණු කොන්ත්‍රාත්කරු වෙත කර්මාන්තය පිරිනැමීමට කටයුතු කර නොතිබුණි.

ප්‍රසම්පාදන කමිටුව විසින් ඒ සඳහා නැවත වරක් විවෘත ලංසු කැඳවීමට තීරණය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 6.31 ක ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මේ නිසා දෙවන වර ලංසු කැඳවා තෝරාගත් කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම නිසා රු.154,084 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස 39 ක් තක්සේරු කර නව තක්සේරු වාර්තාවක් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබුණි. එම තක්සේරු වාර්තාව පදනම් කරගෙන කුලී අයකළ යුතුව තිබුණත්, 2010 වර්ෂයට අදාළව ලබා ගෙන තිබුණු තක්සේරු වාර්තාව පදනම් කරගෙන කුලී අයකිරීම නිසා 2016 වර්ෂයේ සිට 2018 මාර්තු මාසය දක්වා කාලයට අදාළව රු.මිලියන 1.14 ක කුලී අඩුවෙන් අයකර ගෙන තිබුණි.

## 2.9 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2010 වර්ෂයේ සිට 2014 ජනවාරි මාසය දක්වා ගණකාධිකාරී නිවාසයේ පදිංචි වී සිටි ගණකාධිකාරීවරයාගේ පදිංචි කාලය වෙනුවෙන් කුලී අයකිරීමේදී රු.117,634 ක කුලී ප්‍රමාණයක් අඩුවෙන් අයකර ගෙන තිබුණි. එම හිඟහිටි කුලිය 2017 දෙසැම්බර් 08 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීමේදී වැල්ලවාය, සියඹලාණ්ඩුව, තණමල්විල, සෙවනගල හා මොනරාගල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විශ්‍රාමිකයන් 37 දෙනෙකු වෙත රු.මිලියන 6.04 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) 2016 ජනවාරි 12 දිනැති අංක 1/2016 දරන සමාජ සවිබලගැන්වීමේ හා සුභසාධන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 2.4 ඡේදය ප්‍රකාරව අඛණ්ඩව මාස 03 ක් ප්‍රතිලාභ ලබා නොගන්නා ප්‍රතිලාභීන්ගේ නම් පරීක්ෂා කර බලා ලේඛනයෙන් ඉවත් කළ යුතු වුවත්, එසේ නොකර මාස 04 ක සිට මාස 07 ක් දක්වා වැඩිහිටි දීමනා ලබානොගත් ප්‍රතිලාභීන්ගේ නම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. මේනිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක 2016 හා 2017 වර්ෂයන් වෙනුවෙන් වැඩිහිටි දීමනා ලබා නොගත් එකතුව රු.මිලියන 7.65 ක් අදාළ වැය විෂයයන්ට අධිභාර කර තිබුණි.

## 2.10 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

-----------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය<br>-------------<br>රු.මිලියන | උපයෝජනය<br>--------------<br>රු.මිලියන | ඉතිරිය<br>--------<br>රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස<br>--------------- |
|---|---|---|---|---|---|
| 2013 | පුනරාවර්තන | 325.3 | 324.5 | 0.8 | 0.2 |
| | මුලධන | 190.5 | 190.5 | - | - |
| | **එකතුව** | **515.8** | **515.0** | **0.8** | **0.2** |
| 2014 | පුනරාවර්තන | 340.8 | 340.4 | 0.4 | 0.1 |
| | මුලධන | 390.7 | 386.2 | 4.5 | 1.1 |
| | **එකතුව** | **731.5** | **726.6** | **4.9** | **1.1** |
| 2015 | පුනරාවර්තන | 429.5 | 429.3 | 0.2 | 0.04 |
| | මූලධන | 53.7 | 45.1 | 8.6 | 19.0 |
| | **එකතුව** | **483.2** | **474.4** | **8.8** | **19.04** |
| 2016 | පුනරාවර්තන | 464.0 | 458.7 | 5.3 | 1.1 |
| | මුලධන | 120.0 | 118.5 | 1.5 | 1.2 |
| | **එකතුව** | **584.0** | **577.2** | **6.8** | **2.3** |
| 2017 | පුනරාවර්තන | 462.6 | 457.8 | 4.8 | 1.0 |
| | මුලධන | 118.0 | 93.2 | 24.8 | 21.0 |
| | **එකතුව** | **580.6** | **551.0** | **29.6** | **5.1** |

සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණු උපයෝජනයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයයට අදාළ නොවන රු.378,225 ක වියදම් ඇතුළත්වීම නිසා ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයේ වියදම හා එම වත්කම් රු.378,225 ක් බැගින් වැඩියෙන් විසර්ජන ගිණුමේ දක්වා තිබුණි.

**වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

---

වෙනත් අමාත්‍යාංශ 28 ක් හා දෙපාර්තමේන්තු 20 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් එකතුව රු. මිලියන 2,364 හා රු. මිලියන 108 ක් වශයෙන් එකතුව රු. මිලියන 2472 ක් ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු. මිලියන 1,818 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබාදී තිබුණු ප්‍රතිපාදන වලින් රු.මිලියන 654 ක් හෙවත් සියයට 26 ක ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි.

**2.11 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**------------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**-----------------------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 27701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **--------** | | **---------** | | **--------------** | |
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **--------------** | **-------** | **-------------** | **--------** | **---------------** | **--------** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 37.00 | 36.70 | 32.00 | 33.43 | 125.00 | 94.18 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව නිලධාරීන් 11 දෙනෙකුගේ අයවීම් හිඟහිටි ණය ශේෂවල එකතුව, ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.මිලියන 2.42 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ශේෂ අයකරගෙන නොතිබුණි.

**2.12 පොදු තැන්පත් ගිණුම**

**-------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 92.9 ක් විය. මෙම ශේෂ තුළ ඇතුළත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.මිලියන 19.92 ක්වූ තැන්පතු 121 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.13 අනුකූල නොවීම්**

**------------------**

**2.13.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 215(3)(ඇ) | 492,522 | මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2016 වර්ෂයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද නාගහමඩ නීලවබැද්ද මාර්ගය සංවර්ධනය කිරීමට අදාළ මුදල පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි. |
| (ii) **වෙනත් චක්‍රලේඛ** | | |
| 2015 සැප්තැම්බර් 29 දිනැති අංක 02/2015 දරන පරිසර චක්‍රලේඛයේ 2.III ඡේදය | - | දිස්ත්‍රික් ලේකම් හා අනෙකුත් අදාළ පාර්ශවයන් සහභාගිවන කමිටුවක නිර්දේශ නොමැතිව, කැණීම් හා ප්‍රවාහන බලපත්‍ර ලබාගැනීමකින් තොරව බුත්තල ප්‍රාදේශීය ලේකම් සමඟ ගිවිසුම්ගත වී ක්‍රියාත්මක කර තිබුණු සංවර්ධන ව්‍යාපෘති 24 ක් සඳහා පස් / බොරළු කියුබ් 2331 ක් කැණීම් කර ප්‍රවාහනය කර තිබුණි. |

### 2.13.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2013 වර්ෂයේ සිට ලියාපදිංචිය අක්‍රීය වී තිබුණු බදුකරුවෙකු වෙත 2016 වර්ෂයේදී රු.806,053 ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි.

## 2.14 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත හා තථ්‍ය කාර්ය මණ්ඩලය සහ පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය යටතේ රු.මිලියන 385 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 32 | 9 |
| (ii) | තෘතියික මට්ටම | 23 | 5 | 18 |
| (iii) | ද්විතියික මට්ටම | 814 | 636 | 178 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 113 | 103 | 10 |
| | **එකතුව** | **991** | **776** | **215** |